

# ආ මග සටහන්

## දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික, නියෝජ්‍ය විභාග කොමසාරිස්



# සප්ත කන්‍යා කඳුවැටියේ භයානක ගුවන් යානා අනතුර සියැසින් දුටුවෙමි

**(මෙය දශක හතරකට පමණ ඉහතදී ලැබූ අත් දැකීමකි)**

එවකට නවක විද්‍යා අධ්‍යාපන නිලධාරීන් වූ අපට පාසල් නිවාඩු කාලවල දී නේවාසික පුහුණු පාඨමාලා වලට සහභාගී වීමට සිදුවිය. දිවයිනේ විවිධ පළාත්වල පවත්වනු ලැබූ මෙම පාඨමාලා සඳහා අලූතින් පත්වීම් ලැබූ අපි දහසය දෙනෙක් සහභාගී වූයෙමු. මෙම සැසි වලදී විද්‍යා විෂයයන් ඉගැන්වීම, පන්ති අධීක්ෂණය, විද්‍යා උපකරණ අනුයෝගිකරණය වැනි විවිධ තේමා හඳුන්වාදීමත්, කෙටි අධ්‍යයන චාරිකා වලට සහභාගී වීමත් නිසා ඒවා ඉතාමත් ප්‍රියජනක අත්දැකීම් විය.

1974 වර්ෂයේ අවසාන පුහුණු වැඩ මුළුව පැවැත්වූයේ මධ්‍යම පළාතේ ගිනිගත්හේන මධ්‍ය විද්‍යාලයේය. ඉතාම රමණිය පරිසරයක පිහිටි එම විදුහලේ නේවාසික පහසුකම් සහ විද්‍යාගාර පහසුකම් නොඅඩුව තිබිණ. වැඩමුළුව පැවැත්වීම සඳහා සුදානම් කර තිබුණේ දෙසැම්බර් දෙවන දා සිට හත්වන දින දක්වාය. මුල් දින දෙකෙහි කාර්ය සැසි රාශියක් කර පැවරුම් ද කිහිපයක් අවසන් කිරීමට තිබුණු බැවින් එළඹි දිනයේ දිවා ආහාරයෙන් පසු තරමක විවේකයක් ලැබිණ. සියලූම පැවරුම් එදින රාත්‍රී ආහාරයට පෙර අවසන් කළහොත් රාත්‍රියේ අහසේ තරු රටා නිරීක්ෂණයටත්, පසුදින ලක්ෂපාණ විදුලි බලාගාරයේ අධ්‍යයන චාරිකාවක් සඳහා යා හැකි බවත් අපට දැනුම් දෙන ලදී.

සියලූ දෙනාම ලහි ලහියේ පැවරුම් අවසන් කර, රාත්‍රිව අහසේ තරු රටා නිරීක්ෂණය කිරීමට සූදානම් වූහ. මෙය සංවිධානය කරනු ලැබ තිබුණේ ප්‍රධාන විද්‍යා අධ්‍යක්ෂක මහින්ද රණවීර මහතා විසිනි. එදින රාත්‍රී අහස ඉතාමත් පැහැදිලි දිනයක් විය. පසළොස්වක පොහොය තව දින දෙකකිනි. උතුරු දෙසින් සප්ත කන්‍යා කඳු වැටිය, දුර අහසේ ඇඳින ලද සිතුවමක් මෙන් සඳ එළියේ දිස් වෙමින් තිබිණ.

**මධ්‍යම කඳුකරයේ සප්ත කන්‍යා කඳු වැටිය**

රාත්‍රී නවය වනවිට, මිදුලේ දුරේක්ෂයක් (Telescope) සවි කෙරිණ. අසල මේසයක් මත දෙනෙති (Binoculars) කිහිපයක් සහ තරු රටා මුද්‍රිත සිතියම් පොත් කිහිපයක්ද විය. මහින්ද රණවීර මහතා තරු රටා කිහිපයක් පිහිටන ආකාරය විස්තර කර දී දුරේක්ෂයෙන් ඒවා නිරීක්ෂණය කරන ආකාරයද පෙන්වා දුන්නේය. මේ සියල්ල අපට නවතම අත්දැකීම් විය. සියලූ දෙනාම තරු බැබලෙන අහසේ චමත්කාරය රිසිසේ භුක්ති විඳින්නට පටන් ගත්හ.

ඉතාමත් සාර්ථක තරු අධ්‍යයනයක් නිසා අපට වේලාව ගතවන බව නොදැනුණි. රාත්‍රී දහය පසුවී විනාඩි කිහිපයක් ගතවූවා පමණකි. කන් බිහිරි කරවන තරම් මහ හඬ නංවමින් ජෙට් ගුවන් යානයක් විදුහල් භූමිය අසළින් ගස් මුදුන් වල ගෑවෙමින් මෙන් ගියේය. එහි බාහිර විදුලි පහන් වල ආලෝකයෙන් අප සිටි තැනද මොහොතක් ආලෝකමත් විය.

අපි සියලූ දෙනාම තරු බැලීම නවතා ඉතාමත් පහලින් යන අහස් යානය දෙස පුදුමයෙන් බලා සිටියෙමු. තව විනාඩි දෙකකදී පමණ මහා පිපිරුම් හඬක්ද සහිතව ගුවන් යානය සප්ත කන්‍යා කඳු අසල ගිනිගෙන, මල් වෙඩි වැස්සක් මෙන් එහි දැවෙන කොටස් බිම පතිත වන්නට විය. තරු බැලීම නතර කළ අපට මහත් බියක්, චකිතයක් සහ සන්ත්‍රාසයක් ඇතිවිය.



අනතුරට ලක්වූ ගුවන් යානය

අප සියලූ දෙනාම වැඩමුළුව පැවැත්වූ, එම ස්ථානයට අමුත්තන් වූ අතර විද්‍යාලයේ එක් ගුරු මහත්මයෙක් සහ විද්‍යාගාර සහායක මහතා පමණක් ප්‍රදේශය ගැන දන්නා පදිංචි කරුවෝ වූහ.

"සර්, ප්ලේන් එක කඩා වැටුනා. අපට බලන්නට යන්නට හිතයි" කියමින් විද්‍යාගාර සහායක සිරිසේන, මහත් කලබලයකින් අප සිටි තැනට ආවේය.

"අපිත් මේ පුදුම වෙලයි බලාගෙන ඉන්නේ, ඒ උනත් මේ මහ රෑ යන්න පුලූවන්ද? එතෙන්ට කොච්චිර දුරද? හෙට උදේටම බලමුද? හෙට ගමනට අවශ්‍ය දේවල් ලෑහැස්ති කරන්නත් තිබෙනවා නේද?"

වැඩමුළු ප්‍රධානියා ඔහුට ප්‍රශ්න රාශියක්ම ඉදිරිපත් කළේය. මඳක් පසුබට වූ ඔහු "සර්, මේ ළඟමයි පොලීසිය තිබෙන්නේ. පොලීසියෙ අපි දන්න මහත්වරු ඉන්නවා. මම තොරතුරු හොයා ගෙන එන්නම් කියා ඔහු එවලේම පිටත් විය.

අපට තරු ගැන තිබුණු උනන්දුව නැතිවී ගියේය. සිදුවූයේ කුමක්ද යන්න ගැන කිසිම හෝඩුවාවක්වත් නැත. එය බෝම්බ පිපිරීමක්ද, යානයේ යාන්ත්‍රික දෝෂයක්ද, වෙනත් යම් අද්භූත සිද්ධියක්ද යන්න අපට මහත් ගැටලූවකි. තරු රටා බැලීම පසෙකට දැමූ අපි සිද්ධියට අදාළ විය හැකියයි හැඟෙන නොයෙක් දේ ගැන කතා කළෙමු. (ඒ කාලයේ ජංගම දුරකථන නොතිබුණි. විදුහලේ සාමාන්‍ය දුරකථනයක්වත් නොවිය.)

සිරිසේන කඩිනමින්ම ආපසු ආවේය. ඔහු හති ලමින් තොරතුරු රාශියක් හෙළි කළේය.

"සර්, කඩාවැටුන ප්ලේන් එක මක්කම වන්දනාකාරයෝ යන එකක්ලූ. දෙසියයක් විතර එතනම ගිනිබත් වෙලාලූ. මිනිස්සු වැල නොකැඩී යනවා. පොලීසියටත් ඉමර්ජන්සි කෝල් කරලලූ. අපිත් හෙට ගමන නොගොහින් මේක බලන්නට යමු. තේ වත්ත මැද්දෙන් කන්දට හැතැක්ම දෙකක් විතර තියෙනවා." ඔහු දිගටම කියාගෙන ගියේය.




ශ්‍රී ලංකා අහස් සීමාවට ඇතුල්වී අහස්යානය ගමන් කළ ආකාරය

අපි මැදියම් රැය පමණ වනතුරු කතාකරමින් සිට නින්දට ගියෙමු. එවෙලේ සිටම ගිලන් රථ, හෝ හමුදා වාහන වල සයිරන් නලා හඬ, හෙලිකොප්ටර් වල ශබ්ද නිරතුරුවම ඇසෙන්නට විය. ගුවන් යානයේ බියකරු කන් බිහිරි කරවූ හඬ මනසෙහි දෝංකාර දුන් අතර විපතට පත් අයගේ අඳෝනාවල් වැනි විලම්බිත ශබ්ද ද ඇසෙන්නාක් මෙන් දැණින.

අපි කවුරුත් අඩ නින්දේ සිට වෙනදාටත් වඩා කලින් අවදි වූයෙමු. මිදුලට ගොඩ වූ විටම, සප්ත කන්‍යා කඳු වැටියේ දර්ශනය නෙත් ගැටුණි. ඒ සමගම කඳුවැටියේ මැද කන්දකින් විශාල දුමක් නගිනුද දුටිමු. ඒ දැවී අළුවී ගිය සුන්බුන් වලින් නැගෙමින් තිබුණු අවසන් දුම් වළලූ බව තේරුම ගතිමු. පෙරදින රාත්‍රියේ කඳුවැටියේ තිබුණු මනස්කාන්ත දසුන දුම් වළාවෙන් වැසී ගොස්ය. කඳු යායේ පසු බිමද වැසි වලාකුළුවලින් බරවී තිබිණ. මේ සියල්ල නිසා පෙරදින චමත්කාරය අද වන විට බියකරු බවකට පත්ව ඇති බව පෙනුණි. අනපේක්ෂිත ලෙස අහිංසක මිනිසුන් සිය ගණනකගේ ජීවිත එක මොහොතකින් බිළිගත් මෙම කුරිරු අනතුර නිසා සොබා දහමද සොවින් ඇළලී ගොස් ඇති බවක් දිස්විය.

ඒ වන විටත් දහස් ගණනක් සෙනග තේ වත්ත මැදින් කන්ද නගින බව අපි දුටුවෙමු. උදය තේ පානයෙන් පසු කැමති අයට සිරිසේන සහ විදුහලේ ගුරු මහතාද සමග කන්ද පාමුලට යාමට අවසර ලැබෙන බවත් ලක්ෂපාන චාරිකාව අවලංගු කළ බවත්, දහවල් දහයට වෙනත් සැසියක් සඳහා අනිවාර්යයෙන්ම පැමිණිය යුතු බවත් නිවේදනය විය.

සිරිසේන පෙරටු කරගත් අපි, තේ වත්ත මැදින් යන ජන ගංගාවට එකතු වීමු. අප අඩි දෙතුන් සියයක් නගින විට පොලිසිය ශබ්ද විකාශන මගින් ජනතාව අමතා අනතුර සිදුවී ඇති ස්ථානය අසලට නොයන ලෙස තදින් අවවාද කරන්නට විය. අපි එතනින් ඔබ්බට නොගියෙමු. කඳු මුදුනේ සිට තරමක් පහළින් විශාල ප්‍රදේශයක් ගිනිබත්වී දුම් දමමින් තිබිණ. අමු අමුවෙන් මිනිස් සිරුරු දැවෙන විට හමා එන පුළුටු ගඳ ඉවසන්නට බැරි තරම් විය. ගස් වල එල්ලෙමින් තිබුනු පිළිස්සුනු ඇඳුම්, සීසීකඩ විසිරී ගොස් තිබුණු යානයේ සුන්බුන්, අගුරු වී තිබුණු මගී ගමන් මලූ, සෑම තැනම විසිරී තිබුණු කොටස් පිලිස්සී ගිය මුදල් නෝට්ටු ආදිය මේ මහා ඛේදවාචකයේ ඉතිරිව තිබුණු සාක්ෂි විය.

ආපසු පැමිණි අපි අධ්‍යයන කටයුතු ආරම්භ කළෙමු. පෙර දින දෙකෙහි කා තුළත් තිබුණු උද්යෝඅගය අද නැත. උදාසීන ගතියක් තිබේ. සමහරු අනිත්‍යය මෙනෙහි කළහ.

සමහරු තමන්ගේ ගේ දොර, අඹු දරුවන් ගැන සිතන්නට ඇත. එදින සවස් වනවිට අවට ප්‍රදේශයම තහනම් කළාපයක් බවට පත්කරන ලද බව ආරංචි විය. පොලිසිය, යුද හමුදාව, ස්වේච්ඡා සේවක කණ්ඩායම්. ගිලන් රථ සේවා, අවමංගල රථ සේවා ආදිය නිසා මහා මාර්ගයද

**28 වන පිටට**